109 File: Att: DG (COD)

2? 2007

තැ. පෙ.
த. பெட்டி
P.O. Box } 572

දුරකථන
தொலைபேசி
Telephone } 2430860-9 / 2430870-8

මගේ අංකය
எனது இல.
My No. } ඩී/ඍම්එම්පී/7/ජව එන්වයි/ජඑජ්/200

ඔබේ අංකය
உமது இல.
Your No. }

# රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව.

# பாதுகாப்பு, பொதுமக்கள் பாதுகாப்பு, சட்டமும் ஒழுங்கும் பற்றிய அமைச்சு

இல. 15/5, பாலதக்ஷ மாவத்தை, கொழும்பு 03, இலங்கை

# MINISTRY OF DEFENCE, PUBLIC SECURITY, LAW & ORDER,

No. 15/5, Baladaksha Mawatha, Colombo 03, Sri Lanka. modadm@slt.lk.

DGLOG / DL(PH) Can all newly entitled Sevilian & officer will have to sign a form indicating this. Check on willingness. this form Mr. Sirisena at MoD

දිනය
திகதி
Date } 2007 දෙසැම්බර් මස 13

යුධ හමුදාධිපති,
නාවික හමුදාධිපති,
ගුවන් හමුදාධිපති,

**මියගිය, අතුරුදහන්, විවාහක රණවිරුවන්ගේ වැන්දඹුව වෙත ගෙවනු ලබන වැටුප් හා දීමනා වලින් 25%ක් දෙමාපියන් වෙත ගෙවීම හා අසාමාන්‍ය හේතූන් මත මියගිය සන්නද්ධ සේවා පුද්ගලයින්ට වැටුප් හා දීමනා ගෙවීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබ අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයේ පිටපතක් හා ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලද අංක අමප/07/2081/305/082 හා 2007.11.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ පිටපතක් ඔබගේ ඉදිරි කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02 ඉහත අමාත්‍ය මණ්ඩල සංදේශයේ 4 ඡේදයෙහි 1-v දක්වා වූ නිර්දේශයන් අමාත්‍ය මණ්ඩලය අනුමත කල දින සිට එනම් 2007.11.21 දින සිට ක්‍රියාත්මක කරන්න. මේ සම්බන්ධයෙන් යම් ගැටළුවක් ඇත්නම් ඒවා ලිඛිතව මා වෙත දන්වා එවන්න.

( සුනිල් එස්. සිරිසේන )
අතිරේක ලේකම්

අ.කලේ/ ගෝඨාභය රාජපක්ෂ
ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

1h 03 40

රහසිගතයි.

පිටපත්: ජනාධි./ලේ.
අග්‍රා./ලේ.
මු. හා ක්‍ර./ලේ.
සැ.ක්‍රි.කි./ලේ.
විගණකාධිපති.

මගේ අංකය: අමප/07/2081/305/082
ඔබේ අංකය:
2007 නොවැම්බර් මස 29 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය.

රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා
සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

මියගිය, අතුරුදහන්, විවාහක රණවිරුවන්ගේ වැන්දඹුව
වෙත ගෙවනු ලබන වැටුප් හා දීමනා වලින් 25% ක් දෙමාපියන්
වෙත ගෙවීම හා අසාමාන්‍ය හේතූන් මත මියගිය සන්නද්ධ
සේවා පුද්ගලයින්ට වැටුප් හා දීමනා ගෙවීම

(රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ සංදේශය)

2007 නොවැම්බර් මස 21 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

පී.හපන්ගම,
අතිරේක ලේකම්.

අ.කලේ/ඩී.විජේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ඇ) රැස්වීමේදී සභාගත කළ පත්‍රිකා:

44. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 07/2081/305/082 වූ, "මියගිය, අතුරුදහන්, විවාහක රණවිරුවන්ගේ වැන්දඹුව වෙත ගෙවනු ලබන වැටුප් හා දීමනා වලින් 25% ක් දෙමාපියන් වෙත ගෙවීම හා අසාමාන්‍ය හේතූන් මත මියගිය සන්නද්ධ සේවා පුද්ගලයින්ට වැටුප් හා දීමනා ගෙවීම" යන මැයෙන් රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමා ඉදිරිපත් කළ සංදේශය - සංදේශයේ 4 වෙනි ඡේදයේ සඳහන් (I) සිට (V) දක්වා වූ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය දෙන ලදී.

ක්‍රියා කළයුතු: රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

පිටපත: මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

තැ.පෙ. / அஞ்சல் பெட்டி / P.O. Box 572

දුරකථන / தொலைபேசி / Telephone 2430860-9, 2430870-8

මගේ අංකය / எனது இல. / My No. ඩී/සීඩීඑම්පී/ඒවයි/එත්වයි/ඊඑජ්/2007(II)

ඔබේ අංකය / உமது இல. / Your No.

රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு, பொதுமக்கள் பாதுகாப்பு, சட்டமும் ஒழுங்கும் பற்றிய அமைச்சு
இல. 15/5, பாலதக்ஷ மாவத்தை, கொழும்பு 03, இலங்கை
MINISTRY OF DEFENCE, PUBLIC SECURITY, LAW & ORDER
No. 15/5, Baladaksha Mawatha, Colombo 03, Sri Lanka, ministry@defence.lk

දිනය / திகதி / Date ......2007 නොවැම්බර් මස 21 දි

අමාත්‍ය මණ්ඩල සංදේශය

**මියගිය, අතුරුදහන් විවාහක රණවිරුවන්ගේ වැන්දඹුව වෙත ගෙවනු ලබන වැටුප් හා දීමනා වලින් 25% ක් දෙමාපියන් වෙත ගෙවීම හා අසාමාන්‍ය හේතූන් මත මියගිය සන්නද්ධ සේවා පුද්ගලයින්ට වැටුප් හා දීමනා ගෙවීම**

1. ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී හෝ ත්‍රස්තවාදී ක්‍රියා වලින් හෝ ජීවිතක්ෂයට පත්වන සන්නද්ධ හමුදා සාමාජිකයින්ගේ ළඟම ඥාතියා වෙත එසේ මියගිය තැනැත්තාගේ වයස අවු. 55 එළඹෙන දිනය තෙක් මාසික වැටුප් හා දීමනා ගෙවීමට අංක : අමප/1982/305(9) දරණ අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලැබී ඇත.

2. මියගිය අවිවාහකයෙකුගේ දෙමාපියන් වෙත වැටුප් හා දීමනා හිමිවුවත් විවාහකයෙකු වෙනුවෙන් දැනට වැටුප් හා දීමනා හිමිවනුයේ වැන්දඹු බිරිඳට ය. විවාහක රණවිරුවකු මියගිය පසු දෙමාපියන්ට හිමිවනුයේ බිරිඳට හිමි වන්දි මුදලින් කොටසක් එනම් රු. 50,000/-ක් පමණි. එයට ද හිමිකම් ලැබෙනුයේ ඔවුන්ගේ මාසික ආදායම රු. 2000/- ට අඩුනම්ය.

3. මව්බිමේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය සුරැකීම වෙනුවෙන් උත්තරීතර ජීවිත පරිත්‍යාගයෙන් සේවය කළ රණවිරුවන් බිහිකළ දෙමාපියන්ට ජීවත්වීම සඳහා මෙම මුදල කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බැව් රණවිරුවන්ගේ දෙමාපියන් හා විවිධ සංවිධාන මගින් පෙන්වා දෙනු ලැබ ඇත.

4. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා ත්‍රිවිධ හමුදාධිපතිවරුන් නියෝජනය වන පරිදි කමිටුවක් පත් කරන ලදුව, එකී කමිටුව මගින් පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

(2...

I. මියගිය විවාහක රණවිරුවකුගේ වැන්දඹුව වෙත දැනට ගෙවනු ලබන වැටුප් හා දීමනා වලින් 25% ක කොටසක් දෙමාපියන් වෙත ගෙවීම

II. දරුවන් නොමැති වැන්දඹුවක් නැවත විවාහ වීමට කැමති අවස්ථාවල දී බිරිඳට හිමි වැටුප් හා දීමනා වලින් ( 75% ත් ) වසර 10 ක වැටුප් හා දීමනා වලට සමාන වන්දි මුදලක් වැන්දඹුවට එකවර ගෙවීම

III. දරුවන් සිටින වැන්දඹුවන් නැවත විවාහ වීමේ දී බිරිඳට හිමි වැටුප් හා දීමනා වලින් ( 75% ත් ) වසර 10 කට සමාන මුදලින් 50% ක ප්‍රතිශතයක් වැන්දඹුවට එකවර ගෙවීම හා ඉතිරි 50% ක මුදල දරුවන් වෙනුවෙන් භාරකාරත්වයට මාසිකව ගෙවීම.

IV නැහැනු පිරිමි දෙපක්ෂයේම දරුවන්ට වන්දි මුදල් ගෙවිය හැකි උපරිම වයස් සීමාව වයස අවු. 26 දක්වා ඉහළ දැමීම.

V. ක්‍රියාන්විත ප්‍රදේශවලදී පහත සඳහන් හේතූන් ගෙන් මියයන ත්‍රිවිධ හමුදා සාමාජිකයින් වෙනුවෙන් දැනට ගෙවනු ලබන්නේ වන්දි මුදලක් පමණක් වන බැවින් ඔවුන්ගේ යැපෙන්නන්ටද වැටුප් හා දීමනා ගෙවීම.

a. ක්‍රියාන්විත ප්‍රදේශ වල දී අසනීප වීම හේතුවෙන්

b ක්‍රියාන්විත ප්‍රදේශ වල දී දුෂ්කර හමුදා පුහුණුවේ යෙදී සිටිය දී ඇතිවන අධික වෙහෙස නිසා

c. ක්‍රියාන්විත ප්‍රදේශ වල දී රිය අනතුරු වලට ලක්වීමෙන්

d. ක්‍රියාන්විත ප්‍රදේශ වල දී බංකර් කඩා වැටීමෙන්

e. ක්‍රියාන්විත ප්‍රදේශ වල දී දියේ ගිලීමෙන්

f. ක්‍රියාන්විත ප්‍රදේශ වල දී අකුණු සැර වැදීමෙන් .

g. ක්‍රියාන්විත ප්‍රදේශ වල දී විදුලි සැර වැදීමෙන්

h. ක්‍රියාන්විත ප්‍රදේශ වල දී වෙනත් අයෙකු විසින් වෙඩි තැබීමෙන්

i. ක්‍රියාන්විත ප්‍රදේශ වල දී සර්පයින් දෂ්ඨ කිරීම හේතුවෙන්

j. ක්‍රියාන්විත ප්‍රදේශ වල දී තමා වෙත නිකුත් කර තිබූ බෝම්බ/ අවිආයුධ අනපේක්ෂිත අයුරින් පිපිරියාමෙන්

k. ක්‍රියාන්විත ප්‍රදේශ වල දී තමාගේ අවය අත්වැරදීමකින් පත්තුවීමෙන්

l. ක්‍රියාන්විත ප්‍රදේශවලදී සියදිවි හානිකර ගැනීම හැර වෙනත් අයුරකින් සිදුවන මරණ සඳහා

(3....

7. ඉහත 4 ඡේදයෙහි I-V දක්වා වූ නිර්දේශයන් හා මම ද එකඟ වෙමි. එබැවින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කරමි.

මහින්ද රාජපක්ෂ

රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,

නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය

ඩ/